සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

**(01) අංක (i - x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි ප්‍රශ්න අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

**(i) (අ) නූතන අකාරාදියේ අඩංගු වුව ද වර්තමානයේ භාවිතයෙන් බැහැර ව ඇති ස්වර අක්ෂර දෙක ලියන්න.**

- ................................................ ● ................................................

**(ආ) සිංහල හෝඩියේ අන්තර්ගත දන්ත ඕෂ්ඨජ අක්ෂර දෙක ලියන්න.**

- ................................................ ● ................................................

**(ii) (අ) ''උදුල්ල'' යන නාම පදයේ ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.**

................................ + ................................

**(ආ) ''බැලීම්'' යන ක්‍රියා පදයේ ක්‍රියා මූලය හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.**

................................ + ................................

**(iii) ''මී '' යන විවිධාර්ථ පදයෙන් ''මීයා'' , ''මල්පැණි'' පොළොව, වැනි විවිධ අර්ථ මතු වන වාක්‍ය තැනිය හැකි ය. ''දා'' යන්න ද එවැන්නකි. ඉන් අර්ථ දෙකක් පැහැදිලි ව මතු වන සේ නිවැරදි වාක්‍යය දෙකක් ලියන්න.**

(අ) දා :- ..................................................................

(ආ) දා :- ..................................................................

**(iv) (අ) නාමයකට පර ව ''තා'' ප්‍රත්‍යය යෙදුණු තද්ධිත නාමයක් ලියන්න.**

..................................................................

**(ආ) ''ලිය'' යන ධාතුවට පර ව ''ඉලි'' හා ''මන්'' යන භාව කාරක කෘදන්ත ප්‍රත්‍ය යොදා කෘදන්ත පද සකස් කර ලියන්න.**

- ඉලි ........................... + ........................... _______ ...........................
- මන් ........................... + ........................... _______ ...........................

**(v) තද කළු පාටින් මුද්‍රිත පදවල අර්ථය ලිහිල් බසින් ලියන්න.**

**අර්චනීය ගුණයෙන් යුතු උතුමන් අතික්‍රමණය කිරීමට සිතන්නෝ සියතින් ම තම ප්‍රතිරූපය වනසා ගන්නෝ ය.**

(අ) අර්චනීය - ...........................................................................................

(ආ) අතික්‍රමණය - ...........................................................................................

(vi) ''උපකාර කළ අය අමතක කොට බලවත් අය ඇගයීම'' යන අර්ථය දැක්වීමට ''ගඟෙන් වතුර බීලා මුහුදට ආවඩනවා'' යන ප්‍රස්තාව පිරුළ යෙදිය හැකි නම් ''අ'' , ''ආ'' යටතේ එන අදහස් දැක්වීමට සුදුසු පිරුළ බැගින් ලියන්න.

(අ) වැරැද්දේ වගකීම දුබලයාට පැවරීම.

...........................................................................................

(ආ) ජන්මයෙන් ම ලද ගති ඉවත ලිය නොහැකි ය.

...........................................................................................

(vii) පහත සඳහන් යෙදුම්වල නොගැළපීමක් ඇත. එම යෙදුම්වල පළමු හෝ දෙවන වචනය වඩාත් ගැළපෙන සේ සකසා ඉදිරියෙන් ලියන්න.

(අ) කුක්ෂි ගිනි - ...........................................................................................

(ආ) නාග මෙණෙවිය - ...........................................................................................

(viii) පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.

(අ) ගොවියෝ නිපදවන දෙයින් අතර මැදියන් ලාභ ලබති.

...........................................................................................

(ආ) නංගීත් නුඹත් මමත් උදාර එනතුරු බලා සිටියා ය.

...........................................................................................

(ix) (අ) ''තැග්ග'' යන පදය විසන්ධි කොට සන්ධි වර්ගය දක්වන්න.

.................................... + ............................—— ....................................................

(ආ) ''සාගරයක් වගේ ගුණ'' යන ශබ්ද සමූහය සමාස කොට දක්වා එම පදය කවර සමාසයකට අයත් වේ දැයි ලියන්න.

.................................... —— ....................................................

(x) (අ) ප්‍රථම පුරුෂ සර්ව නාම පදයක් ඇතුළත් වාක්‍යයක් ලියන්න.

...........................................................................................

(ආ) ''දූරිය'' යන උක්ත පදයෙහි අනියමාර්ථ අනුක්ත පදය ලියන්න.

...........................................................................................

(ලකුණු 2×10 = 20)

(02) පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරින් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ලියා රචනය ලිවීම අරඹන්න. සුදුසු මාතෘකාවක් යොදන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ.
- යොදාගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

(අ) සුවඳ විහිදුවා පිපෙන මල සේ ම ගසින් වියළී සුළඟට හසු ව පාවී යන කොළය ද සුන්දර පරිසර රටාවකි. එම පරිසර රටා සජීවී ව අඛණ්ඩ ව සුන්දර ව පවතින්නට නම් මිනිස් දෑත අකාරුණික ව පරිසරයට මැදිහත් නොවිය යුත්තේ ය. එවිට අතීත මිනිසා දිවි ගෙවූ සුන්දර මිහිතලය අනාගත පරපුරටද ලැබිය හැක්කේ ය. පරිසරයට එරෙහි මිනිස් ක්‍රියාකාරකම් පිටු දකිමු.

(ආ) අතීත හර පද්ධතීන්හි මානව සබැඳියාව වඩා සවිමත් සමාජ සම්බන්ධතාවක් ගොඩ නැගීමට ඉඩ සැලසීය. විද්‍යාත්මක දියුණුවත් සමඟ සන්නිවේදනයේ නව පිම්මක් ලෙස බිහිවී ඇති ජංගම දුරකථනය අද කුඩා දරුවාගේ සිට මහල්ලා දක්වා භාවිතයට ගනී. ඒ හැම අයෙකු ම දොඩමළු වන්නේ ගනුදෙනු කරන්නේ ජංගම දුරකථනය සමගිනි. මානව සැබැඳියාව පවුල් සංස්ථාවෙන් පලා යන්නට ජංගම දුරකථනය ඉඩ හසර සලසා ඇත. මීට වැට කඩොලු බැඳිය යුත්තේ ය.

(ඉ) මිනිසා සමාජ ජීවියෙකි. එබැවින් සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා සංවාදයේදී තමා කතා බහේ යෙදෙන අයගේ තරාතිරම , වයස, පූජනීයත්වය ආදිය සැලකිය යුතු ය. තමන්ගේ ප්‍රතිරූපය රකිමින් සමාජශීලී ප්‍රියමනාප චරිතයක් ගොඩ නගා ගැනීමට සංවාද හා කතා බහ දිග හැරීමේ දී ප්‍රිය මනාප ව භාෂාව භාවිතයට ගනිමු. ප්‍රසන්න ලෙස එකිනෙකාට ගරුකරන සමාජයක් ගොඩ නගමු.

(ඊ) උත්පත්තියේ සිට මරණය දක්වා එළැඹෙන ඕනෑ ම අවස්ථාවක ජීවිතයට අවශ්‍යවන බහුතරයක් භාණ්ඩ හා සේවා, පහසුවෙන් මිල දී ගත හැකි පරිද්දෙන් අද වෙළෙද පොළේ ඇත. යහපත් හෝ අයහපත් ඕනෑ ම මාර්ගයකින් මුදල් උපයා ගන්නෝ මේ භාණ්ඩ හා සේවා පරිහරණය කරමින් නොවෙහෙසී ඉතා පහසු ජීවිත ගත කරති. බහු භාණ්ඩිකතාව මිනිසා අලස හා රෝගී බවට පත් කරයි. නිකරුණේ කාලය කා දැමීමට හුරු කරයි. එම අවසරයෙන් සමාජයේ තව තවත් භාණ්ඩ හා සේවා නිපදවෙයි. උදාහරණ ලෙස අහස උසට පෞද්ගලික රෝහල් ඉදිවෙයි. කාය ප්‍රවර්ධන මධ්‍යස්ථාන බිහි වෙයි. මේවා රටක සංවර්ධනයේ ලක්ෂණ නොව සමස්ත දේශය ම රෝගී වීමේ පෙර නිමිති නොවේ ද?

(ලකුණු 25)

(03) පහත දැක්වෙන පාඨය වචන 50 - 55 ත් අතර වනසේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන ගණන සාරාංශයේ අග ලියන්න.

භාෂාව යනු පුද්ගලයා සතු විශිෂ්ට සන්නිවේදන මෙවලමයි. මිනිසා අන් සතුන්ගෙන් වෙන් කර දැක්වීමේ දී ගතහැකි ප්‍රබලතම සාධකය වන්නේ භාෂාවයි. භාෂාව කවදා කොහේදී බිහිවී ඇත්දැයි නිශ්චිත ව ම ප්‍රකාශ කළ නොහැකි නමුත් මිනිස් සන්නිවේදනය වඩාත් පුළුල් වීමටත් වඩාත් සාර්ථක වීමටත් ප්‍රබල සාධකයක් වී තිබේ .

මානව ශිෂ්ටාචාරයේ මුල් කාල පරිච්ඡේදය අධ්‍යයනය කිරිමෙන් අපට භාෂණයේ හා ලේඛනයේ ප්‍රභවය හැඳින ගත හැකි ය. වර්තමාන සමාජය තුළ මෙන් ම එදා අතීත සමාජය තුළ ද මානවයා සිය අදහස් තවකෙකුට ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව බරපතල ලෙස පවතින්නට ඇත. වඩාත් සරල සංඥා හා සංකේත භාවිතයෙන් ඔවුන්ගේ අදහස් හුවමාරු කර ගත්ත ද භාෂණ රටාවක් හෝ ලේඛන රටාවක් හෝ සංකීර්ණ සන්නිවේදන ක්‍රමෝපායක් එදා ඔවුන් සතුව නොතිබිණි. භාෂාව බිහි වීම සමාජයේ දැඩි අවශ්‍යතාවක් සපුරාලන්නක් විය.

තාක්ෂණික සංවර්ධනයත් සමඟ ජනමාධ්‍ය බිහි වූ අතර ඒ නිසා ම භාෂා භාවිතයේ නව මං විවර විය. අතීත මානවයා සිතීමට, කතා කිරීමට හා ලිවීමට භාවිත කළ භාෂාව ජනමාධ්‍ය බිහි වීමත් සමඟ පුළුල් භාවිතයකට යොමු විය.

(ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

සංගීත විෂයය තුළ දී ශිෂ්‍යයාගේ විෂය ග්‍රහණ හැකියාව වර්ධනය කරමින් සම්ප්‍රජානන, ග්‍රහණ කැමැත්ත හා වරණ අවධානය ලබා ගැනීම අතිශයින් වැදගත් වේ. මන්ද, ආවේදන ක්ෂේත්‍රයේ ග්‍රහණ අවස්ථාවට අයත් ප්‍රාථමික අවස්ථා ත්‍රිත්වය ඒවා වන බැවිනි. කලා විෂයයන් කෙරෙහි ශිෂ්‍යයා දක්වන මුල් ම ප්‍රතිචාරය ග්‍රහණය යි. එනම් සංගීතය වැනි විෂයයන් කෙරෙහි ශිෂ්‍යයා සංවේදී වීම හා හුරු වීමයි. සංගීත විෂයය කෙරෙහි ශිෂ්‍යයා තමා සතුකරගන්නා දැනීම සම්ප්‍රජානනය වේ. එසේම විවිධ ප්‍රබෝධක හා සංසිද්ධීන් ඉවසා දරා ගැනීමට හුරු කිරීම ග්‍රහණය කැමැත්ත ලෙස හැඳින්වෙයි. වරණ අවධානය යනු කිසියම් ප්‍රබෝධකයක විවිධ අංශ කෙරෙහි වෙන් වෙන් ව යොමු කර ලීමයි. උදාහරණ වශයෙන් නූර්ති ගීයක් ගත් විට එහි ස්ථායී අන්තරා අතුරු වාදන සංගීත භාණ්ඩවලින් ගොඩනගන රිද්මය ආදී වශයෙන් වෙන් වෙන් ව අධ්‍යයනයට යොමු කිරීම පෙන්වා දිය හැකි ය. මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අතිශය භාර ධූර කර්තව්‍යයක් ඉටු කරන සංගීත ගුරුවරයා ග්‍රහණය අවස්ථාව පූරණය කර ගැනීමට ප්‍රායෝගික වූ ක්‍රියාකාරකම් , දෘශ්‍යාධාරක මෙන් ම අධ්‍යාපනික තාක්ෂණික මෙවලම් සියල්ලක් ම පාහේ භාවිතයට ගනී.

(i) මෙම පාඨයෙන් කියැවෙන මුඛ්‍ය කාරණය කුමක් ද?

(ii) අදාළ විෂයය ඉගෙනුම් ආවේදන ක්ෂේත්‍රයේ ග්‍රහණ අවස්ථාව ට අයත් ප්‍රාථමික අවස්ථා කීයද? ඒ මොනවා ද?

(iii) කලා විෂයයන් කෙරෙහි ශිෂ්‍යයා දක්වන මුල් ම ප්‍රතිචාරය මෙහි හැඳින්වෙන්නේ කෙසේ ද?

(iv) 'සම්ප්‍රජානනය' යන්න කෙටියෙන් හඳුන්වන්න.

(v) 'වරණ අවධානය' යන්න පැහැදිලි කිරීම ට මෙම ඡේදයේ භාවිත උදාහරණය උපුටා ලියන්න.

(ලකුණු 02 × 05 = 10)

(05) දේශීය ඖෂධ හා ශාක සාර භාවිතයෙන් සැකසෙන සබන් වර්ගයක් නිෂ්පාදනය කරන රන්ඕවිට, යොවුන් ගම්මානයේ පිහිටි ගෘහී නිෂ්පාදකයන් ගේ සබන් අලෙවිය මේ දිනවල යම් තරමකින් පහත වැටී ඇත. ඒ සඳහා පිළියමක් ලෙස එම ආයතනයේ දැන්වීම් කළමනාකරු වන ඔබ වෙත ආකර්ෂණීය වෙළෙඳ දැන්වීමක් සැකසීමේ කාර්යය පැවරී ඇත. නැවත එම සබන් අලෙවිය නංවා ලීම සඳහා පාරිභෝගික ජනතාව වෙත මුද්‍රිත මාධ්‍යයෙන් යැවෙන වෙළඳ දැන්වීම සකසන්න. සබන් වර්ගයේ නම , නිෂ්පාදනයේ දී භාවිත ද්‍රව්‍යය, භාවිතයෙන් ලැබෙන වාසි, මිල, ඒ සඳහා ලැබෙන වට්ටම් , නිෂ්පාදන ආයතනය, දැන්වීම්කරු ආදී කරුණු අන්තර්ගත වීම අවශ්‍ය වේ. වචන 100ක් පමණ යෙදීම සෑහේ. (ලකුණු 15)

නැතහොත්

පහත සඳහන් දැන්වීමෙ දැක්වෙන ඇබෑර්තුවට ඉල්ලුම් කිරීමට ඔබ සුදුසුකම් සපුරා ඇතැයි සිතා ජීව දත්ත පත්‍රිකාවක් සකසා සම්පූර්ණ කරන්න.

## රැකියා ඇබෑර්තු

ලොව පිළිගත් ''MAM'' සමාගම් ජාලයේ නෙළුම්පුර ආරම්භ කිරීමට නියමිත ශාඛාවේ ලිපිකරු හා පිළිගැනීමේ නිලධාරී යන ඇබෑර්තු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

<u>අපේක්ෂිත සුදුසුකම්</u>

- අ.පො.ස. සා.පෙළ ගණිතය ඉංග්‍රීසි හා සිංහල විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිත ව විෂයයන් 6ක්
- අ.පො.ස. උ.පෙළ ඕනෑම විෂයය ධාරාවකින් සම්මාන තුනක් සහිත සාමාර්ථයක්
- ඉංග්‍රීසි භාෂාව චතුර ලෙස හැසිරවීමේ හැකියාව.
- පරිගණක තාක්ෂණයේ දැනුම.
- අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමකි.
- වයස අවුරුදු 20 - 26 අතර ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම බඳවා ගැනේ.

2017 - 12 - 20 දිනට පෙර අයදුම් කරන්න.

පිරිස් කළමනාකරු.
MAM සමාගම් ජාලය,
ප්‍රධාන ශාඛාව,
වික්‍රමසිංහ මාවත,
කොළඹ 03.

(ලකුණු 15)